**ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික වත්කම් විකිණීමෙන් ලද රු.276,755 ක් වූ මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ භෞතික වත්කම් විකිණීමෙන් ලද ආදායම ලෙස දැක්විය යුතු වුව ද, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්වලට ඇතුළත් කර තිබුණි. | භෞතික වත්කම් විකුණුම් ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම් හි වෙනත් ආදායම් ශීර්ෂයේ සඳහන්කර ඇති අතර, ඉදිරි වර්ෂවලදී මෙම ආදායම ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්වීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | නිවැරදි ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු ය. |

#### (ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (**ACA** 6) සඳහන් මගී වාහනවල වටිනාකම රු.18,654,796 ක් වූ අතර, එය 2022 ජනවාරි 01 දිනට රු.90,026,796 ක් ලෙස **SA** 82 වාර්තාවෙන් ඉදිරියට ගෙනැවිත් තිබුණි. මෙම වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් පැහැදිලිව දක්වා නොතිබුණි. | මෙම වෙනසට හේතුව 2022 වර්ෂයේ මැයි මාසයේ ගිණුම්ගත කරන ලද දෙපාර්තමේන්තුවට 2017, 2018, 2019 හා 2021 වර්ෂයට අදාළ රු.71,372,000 ක් වටිනා වාහන 11 ක වටිනාකම සිගාස් පරිගණක වැඩසටහනේ ආරම්භක ශේෂයට එකතු වීම බව දන්වා තිබුණි. | වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් පැහැදිලිව දැක්විය යුතු ය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛණ පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | | . |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනකර නොතිබුණි. | හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කරන බව දන්වා තිබුණි. | හානි හා පාඩු ලේඛණයක් යාවත්කාලීන කර පවත්වා ගෙනයාමට කටයුතු කළ යුතු ය. |
| (ii) | වාහන ලොග් පොත<br>මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලොග් පොත් යාවත්කාලීන කළ අතර, එය අඛණ්ඩව සිදුකරගෙන යන ලෙස ප්‍රවාහන නිලධාරී දැනුවත් කළ බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය. |

**(ඈ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනතුරුවලට භාජනය වූ වාහන දෙකකට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම වාහනවලට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 අනුව පරීක්ෂණ පැවැත්වීමට ලිපිගොනු ආරම්භ කර නිලධාරීන් පත් කරන ලද අතර, විගණන අවස්ථාව වන විට එම පරීක්ෂණ අවසන්ව නොපැවතීම හේතුවෙන් එම ලිපිගොනු පරීක්ෂණ නිලධාරීන් භාරයේ පැවතුණු බැවින් ලිපිගොනු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් එම පරීක්ෂණ කඩිනමින් අවසන් කර ලිපිගොනු භාරදෙන ලෙස පරීක්ෂණ නිලධාරීන්ට | විගණනයට අදාළ ලිපිගොනු ලබාදීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | දැනුම් දී ඇතිබවත් දන්වා තිබුණි. | |
| (ii) | 2003 පෙබරවාරි මස දෙපාර්තමේන්තුවේ සිදු වූ ගින්නෙන් වූ රු.2,229,111 ක අලාභයට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොවුණි. | 2013 වර්ෂයේ දෙපාර්තමේන්තුව ටොරින්ටන් චතුරශ්‍රයේ තිබූ පැරණි ගොඩනැගිල්ලේ සිට බත්තරමුල්ලේ නව ගොඩනැගිලි සංකීර්ණය වෙත ගෙන ඒම සිදුකර ඇත. එබැවින් මීට අදාළ ලිපිගොනු මෙතෙක් සොයා ගැනීමට නොහැකි වූ හෙයින් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලද බව දන්වා තිබුණි. | අදාළ ලිපිගොනු ආරක්ෂාකාරීව තබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03 (xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, සාම්ප්‍රදායිකව සිදුකරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.19,200,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 13 සිට සියයට 333 අතර පරාසයක් ගෙන තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ ලබාගත් ප්‍රතිපාදනවලින් වැය විෂයයන් තුනක සියයට 24 සිට සියයට 68 දක්වා ඉතිරිවීම් පැවතිණි. | දෙපාර්තමේන්තුවේ ඇති විද්‍යාගාර 10 පවත්වාගෙන යාමට අවශ්‍ය මූලධන හා පුනරාවර්තන වියදම් පමණක්, පවතින තත්ත්වයන් යටතේ ඇස්තමේන්තු කළ ද, ඒ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් කටයුතු කළමනාකරණය කර ගත නොහැකිවීම මත මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන සලසා ගත් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැය විෂයයක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.5,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | කොයිකා ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙන් දැරීමට නියමිත වියදම් ගිණුම් ගතකිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගත්ත ද, වර්ෂය තුළ අපේක්ෂිත කාර්යය කිරීමට නොහැකිවීමෙන් එම මුදල ඉතිරි වී තිබුණු බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට වගබලා ගත යුතු ය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.613,874 ක් වූ බැරකම් හා බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 94 හි සඳහන් විධිවිධානවලට පටහැනිව අංක 233-1-1-2103 මූලධන වැය විෂයයට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු.1,733,847 ක බැරකම්වලට එළඹී තිබුණි. | අදාළ වියදම් මු.රෙ 94(1) අනුව දැරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිණි. දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරී පවත්වාගැනීම සඳහා දැරිය යුතු මෙම වියදම්වලට එළඹීම කල් දැමිය නොහැකි නිසා මු.රෙ 94(2) අනුව මෙම වගකීම් හා බැඳීම්වලට එළඹීමට සිදු වූ බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව බැඳීම් හා බැරකම් වටිනාකම රු.77,378,279 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම (iii) හා (iv) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ එය රු.114,113,636 ක් ලෙස රු.36,735,357 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සිගාස් පරිගණක වැඩසටහන යටතේ දක්වා ඇති බැඳීම් හා බැරකම්වලට වඩා රු.36,735,357 ක් සඳහා වගකීම් හා බැඳීම් වලට එළඹී ඇති බව පිළිගන්නා අතර, එසේ බැඳීම් හා බැරකම් වලට මු.රෙ 94(2) හි ඇති ප්‍රතිපාදන මත එළඹී බවද, වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත සිගාස් පරිගණක වැඩසටහනට මෙම රු.36,735,357 ඇතුළත් කළ නොහැකි වූ බව ද, දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර එය 2022 ජනවාරි 20 දින ඉදිරිපත් කර ඇති නමුත් අභ්‍යන්තර විගණකවරයෙකු වැඩබැලීමේ පදනම මත සිටිය ද, ස්ථිර කෙනෙක් නොමැතිවීම නිසා සැලැස්ම ප්‍රකාරව කටයුතු සිදුනොවුණි. 2022 වර්ෂයේ නොවැම්බර් මස සිට වැඩ බැලීමේ පදනම මත හෝ අභ්‍යන්තර විගණකවරයෙකු දෙපාර්තමේන්තුවේ නොමැති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XV වැනි පරිච්ඡේදයේ 10.3 වගන්තිය | රාජ්‍ය නිලධාරියකු රටින් බැහැරවීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය, අඩුම වශයෙන් නිලධාරියා පිටත්වයාමට දින දහයකට කලින් අනුමැතිය ලබා ගැනීම සඳහා අදාල | ඉන්දියානු රජය මඟින් පිරිනමනු ලබන ITEC පුහුණු පාඨමාලාව සඳහා ආරාධනා කිරීමේ ලිපිය (Invitation Letter) සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන්නේ | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකුගේ අයදුම්පත්‍ර එම නිලධාරීන් රටින් පිටවූ පසු අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | විදේශගතවීමට නියමිත දිනට දින දෙකකට පමණ පෙර වේ. එබැවින් විදේශ නිවාඩු ලබාගැනීම සඳහා පරිශිෂ්ඨ 16 සම්පූර්ණ කර විධිමත් පරිදි ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව දන්වා තිබුණි. | |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 104 (4) | WPNA 9276 දරණ රථයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කළ අතර, මින් ඉදිරියට අනතුරක් සිදු වූ වහාම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර මාස 03 ක් ඇතුළතදී පූර්ණ වාර්තාව ඉදිරිපත් කර කටයුතු අවසන් කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුවට අයත් වාහන 18 ක් සඳහා ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත් කොට නොතිබුණි. | ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා 2023 මැයි මස සිට විධිමත් පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදන ලදී. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| **(iii) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | | |
| 2010 ජූලි මස 09 දිනැති අංක CA/1/1/16/1 හා 1993/12/31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන චක්‍රලේඛය | රාජ්‍ය නිලධාරීන් විදේශ සංචාරයක යෙදී දිවයිනට පැමිණීමෙන් දින හතක් තුළ චක්‍රලේඛයෙහි ඇමුණුම් ආකෘතිය අනුව වාර්තාවක් විදේශ ගමන අනුමතකළ බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, නිලධාරීන් දෙදෙනෙකු විසින් | අදාළ වාර්තා ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කළ බවත්, මින් ඉදිරියට පුහුණු පිරිනමන අවස්ථාවේ දී මෙම වාර්තාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමට සටහන් කර ගත් බවත්, දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය පරිදි එවැනි වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි. | | |
| **(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | | | |
| 5.1 ඡේදය | ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කරන ලද දුර ප්‍රමාණය ලොග් සටහන් පොතෙහි දිනපතා ඇතුළත් කළ යුතු වුව ද, එසේ සිදු කර නොතිබුණි. | ඉන්ධන ප්‍රමාණය සහ දුර ප්‍රමාණය දෛනික ධාවන සටහන් පොතෙහි ඇතුළත් කරන අතර, වාහන ලොග් පොතෙහි ඇතුළත් නොකළ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |
| 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුව ද, එසේ කර නොතිබුණි. | 2020 / 2021 වර්ෂවල පැවති වසංගත රෝග ව්‍යාප්තිය මත කාර්යාලය වසා තැබීම, නිලධාරීන් සේවයට නොකැඳවීම මත මෙන්ම 2022 වර්ෂයේ පැවැති ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව නියමිත දිනට පැවැත්වීමට නොහැකි විය. කෙසේ වුවද, 2022 වර්ෂයේ වාහන 08 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකරන ලද අතර, 2023 වර්ෂයේ සියලුම වාහන සඳහා (24) ඉන්ධන පරීක්ෂාව මේ වන විට සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |
| **(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006** | | | |
| (4)(2) වගන්තිය හා 4 (2)(2) ඡේදය | මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇති නමුත් වසර 03 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැති බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්තිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (ආ) හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, රජයේ රස පරික්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අවස්ථා 11 ක දී ලබාගත් රු.329,500 ක අතුරු අග්‍රිම පියවීම දින 21 සිට දින 157 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | අත්තිකාරම් ලබාගත් පසු නැවත අත්තිකාරමේ බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති බව පිළිගන්නා බවත්, එම කටයුතු පසු විපරම් කරමින් නියමිත පරිදි ඉටුකිරීමට අදාළ අංශ දැනුවත් කර ඇති අතර, 2023 වර්ෂයේදී නියමිත කාලසීමාව තුළ අතුරු අග්‍රිමයන් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුළ දී එම අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | අදාළ වියදම නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමකින් තොරව අත්තිකාරම් මුදල් ලබාගෙන තිබූ අතර, ඒ අනුව ලබා ගත් මුදල් හා වියදම් කළ මුදල් අතර, සියයට 35 සිට සියයට 66 ක පරාසයක ඉතිරිවීම් පැවතුණි. | අත්තිකාරම් ලබාගත් පසු නැවත අත්තිකාරමේ බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති බව පිළිගන්නා අතර, එම කටයුතු පසු විපරම් කරමින් නියමිත පරිදි ඉටුකිරීමට අදාළ අංශ දැනුවත් කර ඇත. 2023 වර්ෂයේදී නියමිත කාලසීමාව තුළ අතුරු අග්‍රිමයන් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇතිබව දන්වා තිබුණි. | අග්‍රිම අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම මූලධන වියදම් දැරීම සඳහා පමණක් සකස්කර තිබූ අතර, ආයතනයේ ප්‍රධාන කාර්යය ඉටුකිරීම සහ අනෙකුත් පුනරාවර්තන වියදම් දැරීම පිළිබඳව ක්‍රියාකාරකම් | වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මූලධන වියදම් දැරීම සඳහා පමණක් සකස් කළ බව පිළිගන්නා අතර, එළඹෙන වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී පුනරාවර්තන වියදම් ද, ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මූලධන හා පුනරාවර්තන වියදම් ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත්කර නොතිබුණි. | | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත වී නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ඉහත චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සේවයේ නියුතු කාර්යය මණ්ඩලය, වාර්ෂික අක්මුදල් අවශ්‍යතාවය පිළිබඳ විස්තර හා ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත්කර තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 7700 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, 2022 වර්ෂයේ දී තවත් නඩු 45245 ක් ලැබී තිබුණි. මින් 2022 වර්ෂය තුළ දී වාර්තා කළ නඩු සංඛ්‍යාව 40756 ක් වන අතර, වර්ෂය අවසානයේ විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 12189 ක් ඉතිරි වී තිබුණි. එය 2022 වර්ෂය තුළ පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 23 ක් විය. | 2022 වර්ෂය තුළ ලැබුණු නඩු සංඛ්‍යාව ඉහළ යාම, කාර්යය මණ්ඩල පුරප්පාඩු, ආර්ථික ගැටළු මෙන්ම රටේ පැවති ගැටළුකාරී තත්ත්වය නිසා මෙම තත්වය උද්ගත වී තිබුණු බව දන්වා තිබුණි. | කාර්යය මණ්ඩල ගැටළු කඩිනමින් විසඳා ගෙන ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) මගින් දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 4 ක ප්‍රදානයක් ලබා දී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් KOICA ව්‍යාපෘතියෙහි උපදෙස් පරිදි රු.මිලියන 55 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා ඇස්තමේන්තු කර තිබුණද, රු.103,935 ක මුදලක් පමණක් වියදම් ලෙස දරා තිබුණි. KOICA ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ගෙවීම් කටයුතු සිදුකරනු ලබන බැවින් මෙම වියදම් දරන ලද කාරණය විගණනයේ දී පැහැදිලි නොවීය. | මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ව්‍යාපෘතියේ කාල රාමුවට අනුව දැරීමට නියමිත වියදම් ගිණුම්ගත කිරීමේ අපේක්ෂාවෙන් ඉල්ලුම් කළ ද, අදාළ කාලරාමුව තුළ ඉටුකිරීමට අපේක්ෂිත කාර්යය කිරීමට නොහැකි වූ නිසා එම වර්ෂය අවසානයේ අදාළ ව්‍යාපෘති කාර්යාලය රු.103,935 ක වියදමක් පමණක් දැනුම් දුන් අතර, ඒ අනුව අදාළ වැය විෂයය යටතේ රු.54,896,065 ක ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | විදේශ ආධාර මත ලැබෙන මුදල් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතු ය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (4) (2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු අතර, එහි 4 (2) (2) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇති නමුත් 03 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් මේ වන විට පිළියෙල කර නොමැති අතර, 2024 වසර සඳහා පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු ය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ අමාත්‍යාංශයට අයත් වාහන තුනක් 2020 පෙබරවාරි මස සිට ද, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2015 ජුනි මස සිට ද, විධිමත් පවරාගැනීමකින් තොරව විගණිත දිනය වූ 2023 මාර්තු 20 දක්වා දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා යොදවා තිබුණි. | මෙම වාහන හතර විධිමත් පරිදි පවරා ගැනීමට අමාත්‍යාංශය හා සම්බන්ධ වෙමින් කටයුතුකර ගෙන යනු ලබන අතර, ලිපිගොනු හා අදාළ තොරතුරු සොයා ගැනීමට ප්‍රමාද වූ බැවින් මෙම කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් වාහන කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 7 ඡේදය ප්‍රකාරව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.42,937,521 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ හා වර්ෂය තුළදී අපහරණය කරන ලද රු.5,997,633 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීමේදී ඉඩම් හා ගොඩනැගිලි සහ වාහන පිළිබඳ විස්තර පමණක් ඉදිරිපත් කළ අතර, යන්ත්‍ර හා උපකරණ පිළිබඳ විස්තරත් සමඟ සම්පූර්ණ වාර්තාවක් 2023 වර්ෂයේ සිට ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු 2023 වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු ය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා 2021 සැප්තැම්බර් මස විදේශ ගතවූ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයකු එරටේදී අසනීපවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් මස නැවත ලංකාවට පැමිණ තිබුණු අතර, එම නිලධාරියාට පාඨමාලා ගාස්තු ඇතුළුව අනෙකුත් වියදම් සඳහා | රෝගී තත්වය නිසා මෙම නිලධාරියාට නැවත එම පාඨමාලාව හැදෑරීමට නොහැකි බව, ශ්‍රී ලංකාවට පැමිණ මාස 03 ක කාලයක් ඖෂධ ගැනීමෙන් පසු අප වෙත ලිඛිතව දැනුම් දී තිබුණි. අදාළ විශ්ව විද්‍යාලයට මේ බව දැනුම් දුන් අතර, නිලධාරියාගේ පාඨමාලා | පාඨමාලාව සඳහා රජයට වැය වූ මුදල අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | දරන ලද රු.6,281,948 ක මුදල දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. | ගාස්තුවෙන් සියයට පනහක් ලෙස ගෙවන ලද පවුම් 12,150 ක මුදල ආපසු විශ්ව විද්‍යාලයෙන් දෙපාර්තමේන්තුව වෙත අයකරගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකර ඇත. එම මුදලද ලැබුණු පසු රජයට අමතර මුදලක් වැයවී ඇතිද යන්න ගණනයකර අධිකරණ අමාත්‍යාංශයට දැනුම්දීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | |
| (ආ) | වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් තිදෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් එම නිලධාරිනියන් තිදෙනාගෙන් අයකර ගත යුතු ව තිබූ රු.2,945,922 ක මුළු දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරීන් තිදෙනා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගෙන ගොස් ඇති බැවින් ඇපකරුවන්ද නොමැති නිසා රු.2,945,922 ක් වූ දණ්ඩන මුදල මේ දක්වා අයකරගැනීමට නොහැකි වී ඇති අතර, මේ සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තුවන බව දන්වා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | වැටුප් සහිත නිවාඩු ලබා 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා උපාධි පාඨමාලාවක් හැදෑරීමට විදේශ ගත වූ සහකාර රස පරීක්ෂකවරියක නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පාඨමාලා ගාස්තු හා අනෙකුත් වියදම් සඳහා එම නිලධාරිනියට දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු.9,270,726 ක මුදල නිලධාරිනියගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරිනිය සේවා අවශ්‍යතාවය මත එක් වර්ෂයක පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා 2019 සැප්තැම්බර් 16 දින විදේශ ගතවී ඇතත්, 2020 සැප්තැම්බර් 17 දින නැවත ඇය මෙරටට පැමිණ නොමැති අතර, එදින සිට ක්‍රියාත්මක වන පරිදි ඇය වෙත සේවය හැර යාමේ නිවේදනය නිකුත්කර ඇත.<br>ගිවිසුම් ප්‍රකාරව නිලධාරිනියගෙන් අයකර ගත යුතු මුදලින් මේ වනවිට රු.2,260,000 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරි මුදල රු.180,000 බැගින් වූ වාරික 41 කින් ගෙවා නිම කරන බව ලිඛිතව දැනුම් දී ඇත. ඒ අනුව ඇය විසින් 2023 මාර්තු මස සිට මාසිකව රු. 180,000 ක මුදලක් දෙපාර්තමේන්තු ගිණුමට බැර කරනු ලබන බව දන්වා තිබුණි. | අත්සන්කර ඇති ඇප බැඳුම්කරය අනුව එම මුදල ඇපකරුවන්ගෙන් අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 (i) ප්‍රකාරව පුරවැසි / සේවාලාභි ප්‍රඥාප්තියක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් පුරවැසි / සේවාලාභි ප්‍රඥාප්තියක් සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අංශයෙන් අංශයට සැපයෙන සේවාවන් එකිනෙකට බොහෝ දුරට වෙනස් වන බැවින් අංශයෙන් අංශයට වෙන වෙනම සේවාලාභී ප්‍රඥාප්ති සකස් කර ඇති අතර, සමස්ත දෙපාර්තමේන්තුවම සඳහා එක් සේවාලාභී ප්‍රඥාප්තියක් සකස් කර නැත. එය ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) වගන්තියට අනුව සෑම ආස්ථිතයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබිය යුතු වුව ද, දෙපාර්තමේන්තුව සඳහා එවැනි කමිටුවක් පිහිටුවා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩු වී ඇති නිසා දෙපාර්තමේන්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් නොමැති බව පෙන්වා දෙන අතර, දැනට අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධ වී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | විගණන පනතේ කාර්යයන්වලට අනුගත වී කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරි වන, තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 27 ක් හා තෘතීයික මට්ටමේ නිලධාරීන් 10 දෙනෙකුගෙන් 9 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු මනා ලෙස හසුරුවා ගැනීමට බාධාවක් වී තිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 3 ක් සඳහා මේ වනවිට නිලධාරීන් අනුයුක්තකර ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක්, තෘතීය මට්ටමේ තනතුරු 4 ක්, ද්විතීය මට්ටමේ තනතුරු 16 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් බඳවා ගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.<br><br>නව බඳවාගැනීම් මගින් සම්පූර්ණ කළ යුතු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 25 ක් සහ ද්විතීය මට්ටමේ තනතුරු 10 ක් නව බඳවා ගැනීම් අත්හිටුවීමට රජය මගින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය මත සම්පූර්ණ කිරීමට නොහැකිව පවතී.<br><br>තෘතීය මට්ටමේ තනතුරු 05 දෙපාර්තමේන්තුගත තනතුරු වන අතර, දැනට සේවයේ නියුතු කිසිඳු රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරියෙකු සුදුසුකම් සපුරා නොමැති හෙයින්, සම්පූර්ණ කළ නොහැකිව පවතී.<br>අනෙකුත් තනතුරු සඳහා බහුකාර්ය බලකා සංවර්ධන පුහුණු නිලධාරීන් ලබාගැනීමට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇති බව දන්වා තිබුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට මූලිකත්වය දිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ආයතනයේ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර නොතිබූ අතර, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. එමෙන්ම සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි. | ඉදිරියේදී රා.ප.ව 02/2018 ප්‍රකාරව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |